ජාතික ළමා ආරක්ෂක අධිකාරිය



පුවත් හසුනකට වඩා වැඩි යමක්...

2014 අගෝස්තු කලාපය



# අන්තර්ජාලය හරහා සිදුවන ළමා අපයෝජන අවම කරමු

## හැඳින්වීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමස්ත ශ්‍රී ලාංකේය ළමා පරපුර සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් ඔවුන්ට වඩාත් සුරක්ෂිත සමාජ වටපිටාවක් නිර්මාණය කිරීමේ අභියෝගාත්මක මෙහෙවරෙහි නිරතව සිටී. දැයේ දරුවන් සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් වැඩසටහන් රැසක් වර්තමානය වන විට ක්‍රියාත්මක කරමින් සිටී. කෙසේ නමුත් දරුවන් අපයොජනයන්ගෙන් ආරක්ෂා කරගැනීමට නම් අපයෝජකයා ඔවුන්ට ප්‍රවේශ වන මාර්ග අහුරා දැමිය යුතුමය. සන්නිවේදනයේ නිම් වලලු පුලුල්වීමත් සමඟ අන්තර්ජාලයද ජනතාවට ක්‍රමිකව සමීප වී ඇත. නමුත් භයානකම කාරණය වන්නේ ඇතැම් පිරිස් මෙකී අන්තර්ජාලය හරහා දරුවන් ලිංගික හා මානසික අපයෝජනයට ලක්කිරිමට උත්සහ ගැනීමය. මෙය වර්තමානය වන විට ප්‍රබල ලෙස උත්සන්නව පවතින ගැටලුවක් හෙයින් ඒ පිළිබඳ අවධානය යොමුකර දැයේ දරුවන් ආරක්ෂා කරගැනීමට සියළු දෙනා එකා වන්ව පෙළ ගැසීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

## අන්තර්ජාලය හරහා සිදුවන ළමා අපයෝජන

**'දැන ගියොත් කතරගම නොදැන ගියොත් අතරමග'** යන්න පැරණි සිංහල කියමනකි. එකී කියමන අන්තර්ජාලය සම්බන්ධයෙන් මනාවට ගැලපේ. අන්තර්ජාලයේ ඇති සියළු දේ නොගැලපෙන අයහපත් දේ නොවේ. එමගින් අධ්‍යාපනය ලබාදීම, විශ්ව ව්‍යාප්තව තොරතුරු සම්ප්‍රේශනය, විනෝදාස්වාදය ලබාදීම, සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ පුද්ගල සම්බන්ධතා ගොඩනැගීම වැනි බොහෝ දේ සිදුවේ. කෙසේ නමුත් අන්තර්ජාලයේ ඇති ඇතැම් දේ ළමා ජීවිත වලට සිදු කරන්නේ විශාල හානියකි. මේ තුළ ඇති සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ දරුවන් අපයෝජනයට ලක්වන අවස්ථා අප බොහෝ සෙයින් දැක ඇත. ඇතැම් විට සිසු ජීවිතද බිලිගෙන ඇත. සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ හදුනාගන්නා පුද්ගලයින් මඟින් ළමයින් අපයෝජනයවීම වර්තමානය වන විට ප්‍රබලව දක්නට ලැබෙන කරුණක් බවට පත්ව ඇත. ඒ පිළිබඳ තොරතුරු රැසක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අන්තර්ජාල ආවේක්ෂණ ඒකකයටද වාර්තා වී ඇත. එමෙන්ම අන්තර්ජාලය තුළ පවතින අසභ්‍ය ප්‍රකාශන ළමයින්ට පෙන්වීම තුලින්ද, ඔවුන්ව අපයෝජන කාර්යය සඳහා යොදාගැනීමට ඇතැම් පුද්ගලයන් උත්සහ ගනී. එම තත්වයන් වලක්වාලීමට කටයුතු කිරීම ඔබ අප සැමගේ වගකිම මෙන්ම පරම යුතුකමක් ද වේ.



## අන්තර්ජාලය හරහා ළමා අපයෝජන සිදුවේනම් නොපමාව දැනුම් දෙන්න

අන්තර්ජාලය හරහා ළමා අපයෝජන සිදුවන්නේනම් වහාම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඇතුලු අදාල අංශ දැනුවත් කිරීමට නොපමාව කටයුතු කිරීම රටවැසි සියලු දෙනාගේ වගකීම මෙන්ම යුතුකමකි. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අදාල තොරතුරු කඩිනමින් ලබාදීම 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඔස්සේ සිදුකල හැකිය. සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි යන ත්‍රෛභාෂාවන්ගෙන් 24 පැය පුරා ක්‍රියාත්මක මෙම ක්ෂණික දුරකථන අංකයට අදාල පැමිණිලි සිදුකිරීම සඳහා ඔබට කිසිදු මුදලක් වැය නොවේ. ඊට අමතරව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකයටද අදාල ළමා අපයෝජන පිළිබඳව පැමිණිලි කළ හැක. එමෙන්ම මෙවැනි සිදුවීම් පිළිබඳව දිවයිනේ ඕනෑම පොලිස් ස්ථානයකටද පැමිණිලි සිදු කළ හැකිය.

## අන්තර්ජාලය, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආවේක්ෂණයට

අන්තර්ජාලය හරහා සිදුවන ළමා අපයෝජන අවම කිරීම සඳහා අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය නමින් විශේෂ ඒකකයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ පිහිටුවා ඇත. Face Book (මුහුණු පොත) වැනි සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ ළමයින් අපයෝජනය කරන පුද්ගලයින් සොයා මෙම ආවේක්ෂණ ඒකකයේ කටයුතු ක්‍රියාත්මක වේ. එවැනි පුදුගලයින් නීතියේ රැහැනට හසුකරගැනීම ද මෙමගින් සිදුකෙරේ.


## අන්තර්ජාලය භාවිතයේදි අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රම

වර්තමානයේ ළමුන්ගෙන් බොහෝ දෙනෙකුට පරිගණක භාවිතා කළ හැකිය. අන්තර්ජාලය අගනා තොරතුරු මූලාශ්‍රයක් වුවත් එය ළමා අපයෝජකයන්ට, ළමුන් සහ නව යෞවනයන් සම්බන්ධ කරගැනීමට ඉඩසලසන මාධ්‍යයක් ලෙසද ඇතැම්විට කටයුතු කරනු ලබයි. ඔබගේ දරුවා අන්තර්ජාලයේ බොහෝ වෙලාවක් ගත කරයිද? ඔහු ඔබ පරිගණකය අසලින් යන විටදී පරිගණකයේ තිරය හදිසියේ වෙනස් කරන්නේද, යනාදී කරුණු පිළිබඳව වගකිවයුතු දෙමාපියකු ලෙස ඔබ ඉතා සැලකිලිමත් විය යුතුයි.

- ළමුන් අන්තර්ජාල භාවිතය අධීක්ෂණය කරන්න, පරිගණකය පවුලේ සියලු දෙනාම ගැවසෙන පොදු ස්ථානයක තබන්න
- අන්තර්ජාලය තොරතුරු ලබාගැනීමට සහ ඉගෙනීමට මහඟු අවස්ථාවන් සලසන බවත් නමුත් සැබෑ ලෝකයේ මෙන්ම එයට ආවේනික වූ අනතුරු දායක තත්වයන් ඇති බවත් ඔබගේ ළමුන්ට උපදෙස් දෙන්න
- කිසිදු අවස්ථාවකදී ළමයින්ගේ නම, පාසලේ නම, දුරකතන අංකය යනාදී තොරතුරු බාහිර පුද්ගලයන්ට ලබා නොදෙන ලෙසත්, කිසිවිටක ළමයින්ගේ ඡායාරූපය සමාජ ජාලයන්ට ඇතුලත් නොකරන ලෙසටත් ඔවුන් දැනුවත් කරන්න
- සමාජ ජාලයන් හා සම්බන්ධ වූ නව යෞවනයන්ට ඇතිවූ ගැටලු හා එහි ප්‍රතිවිපාක පිළිබඳවත් ළමුන්ට පහදා දෙන්න
- කිසිම පුද්ගලයකු සමග අන්තර්ජාලය හා සම්බන්ධ නොවීමට ළමයින්ට උපදෙස් දෙන්න
- නොහඳුනන පුද්ගලයන්ගෙන් ලැබෙන පණිවිඩ හෝ ඡායාරූප විවෘත කර බැලීම හෝ ප්‍රතිචාර දැක්වීම නුසුදුසු බවත් එය අනතුරු දායක විය හැකි බවත් ළමයාට පවසන්න එමෙන්ම එවැනි දේ ඔබට පවසන ලෙසටත් දරුවාට උපදෙස් දෙන්න
- අන්තර්ජාලය හරහා සම්බන්ධ වන පුද්ගලයන් ඔවුන් විසින් හඳුන්වාදෙනු ලබන පුද්ගලයා නොවිය හැකි බව පවසන්න. ඇය වයස අවුරුදු 12 ක ගැහැණු ළමයෙක් බව පවසන තැනැත්තෙක් ළමා අපයෝජනයකට සැරසෙන වැඩිහිටියෙක් විය හැකිබවද දරුවාට හොඳින් අවබෝධ කර දෙන්න

# අන්තර්ජාලය හරහා ළමා අපයෝජන සිදු කළහොත් වසර 10 ක සිර දඬුවමක්

**<u>2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 360 (ඉ) වගන්තියට අනුව -</u>**
ලිංගිකව අපයෝජනය කිරීමේ කාර්යය සඳහා ළමයෙකු පොළඹවාගැනීමට ඇවටිලි කරන ඕනෑම තැනැත්තෙකුට එරෙහිව අවුරුදු 10 කට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩයක් නැතහොත් එම දඬුවම් දෙකම ලබා දිය හැක.



**<u>1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 286 (අ) වන වගන්තියට අනුව -</u>**
ළමයින්ට අදාලව අසභ්‍ය පලකිරීම් හා ප්‍රදර්ශන ආදිය සිදුකරන ඕනෑම තැනැත්තෙකුට එරෙහිව අවුරුදු 2 කට නොඅඩු හා අවුරුදු 10 ක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් සිදුකල හැක. තවද එම තැනැත්තාට දඩ මුදලක්ද ගෙවීමට සිදුවේ.

අන්තර්ජාලය තුළ පවතින Face Book වැනි සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ ළමයින්ව අපයෝජනය කරන හා අපයෝජනය සඳහා පොළඹවන තැනැත්තන්ට එරෙහිව ඉහත පනත් 02 කට අදාලව දඬුවම් නියම කළ හැක.

# සභාපතිතුමියගේ පණිවිඩය



හොඳම දේ දරුවන්ට යනු පැරණි කියමනකි. හෙළ පෞඪ ඉතිහාසයකට උරුමකම් කියන අභිමානවත් ජාතියක් වන අපි දැයේ දරුවන්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියාකල යුතුය. මෙහිදී අප කළ යුත්තේ හොඳම දේ දරුවන්ට යන පැරණි කියමන පසක් කරමින් උචිත දෙය පමණක් දරුවන්ට ලබාදීමය. වර්තමානය වන විට අන්තර්ජාලය හරහා ළමා අපයෝජන සිදුවන ආකාරය අපට බහුලව අසන්නට දකින්නට ලැබේ. එය ඛේදනීය තත්වයකි. මේ පිළිබඳව අවධානය යොමු කළ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අන්තර්ජාල ආවේක්ෂණය ආරම්භ කරන ලදි. ඒ මඟින් අධිකාරිය බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාලය හරහා ළමුන් අපයෝජනයට ලක්වීම වැලැක්වීම, අන්තර්ජාලය ඔස්සේ දරුවන් අපයෝජනයට ලක්කරන පුද්ගලයින් නීතියේ රැහැනට හසුකර ගැනීම, ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාලය හරහා දරුවන් අපයෝජනයට ලක්කල හැකියැයි යන විශ්වාසය බිඳහෙළීම, අන්තර්ජාලය හරහා ළමයින්ට අසභ්‍ය ඡායාරූප හා වීඩියෝ මුදාහැරීම වැලැක්වීම, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක අසභ්‍ය අන්තර්ජාල වෙබ් අඩවි හඳුනාගැනීම සහ එම තොරතුරු නීතිමය කටයුතු සඳහා යොමු කිරීම වැනි අරමුණු ඉටුකර ගැනීමයි. විශේෂයෙන් අන්තර්ජාලය හරහා ළමයින් අපයෝජනයට පත් කරන පුද්ගලයින් පිළිබඳව හෝ වෙනත් ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳව දැනගත් විගසම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ පැය 24 පුරාවටම ක්‍රියාත්මක '1929' ශ්‍රී ලංකා ළමා දුරකතන සේවය වෙත කඩිනමින් දැනුම් දෙන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි. එය සුරක්ෂිත දරු පරපුරක් රටට උරුම කරදීම සඳහා ඔබ විසින් සිදු කරන මහඟු සේවයකි. නිවස තුළදී මෙන්ම නිවසින් පරිබාහිර සමාජය තුළද දරුවා සුරක්ෂිත කිරීම සඳහා දෙමාපියන් ගුරුවරුන් ඇතුලු සියලුම වගකිව යුත්තන් වඩාත් අවබෝධයකින් සහ අවධානයකින් පසුවිය යුතු බව මම විශ්වාස කරමි. එම නිසා සියලුම දැයේ දරුවන් අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරගනිමින් ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා නිරතුරුවම අප සමඟ එක්වන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි.

# නියෝජ්‍ය සභාපතිතුමියගේ පණිවිඩය



දැයේ සියලුම දරුවන් කායික මානසික ලිංගික හා නොසලකාහැරීම යන සියලුම ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරගත යුතුය. එය සමාජයේ ජීවත්වන එක් පාර්ශවයකට පමණක් කළ හැක්කක් නොවේ. ඒ සඳහා කිසිදු බේදයකින් තොරව සියලු දෙනා ඒකරාශි විය යුතුය. අන්තර්ජාලය හරහා ළමා අපයෝජන සිදුවීමද වර්තමානය වන විට සිදු වෙමින් පැවතීම කණගාටුවට කරුණකි. අන්තර්ජාලය වැනි දේ භාවිත කළ යුත්තේ යහපත් කාරනා සඳහා මිස අයහපත් දේ සඳහා නොවේ. දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටද අන්තර්ජාලය භාවිතා කරන අන්දම පිළිබඳව අවබෝධයක් ලබාදිය යුතුය. නොඑසේ නම් ඇතිවන සමාජ ප්‍රශ්න සුලුපටු නොවේ. එම නිසා මේ සියල්ල සිදු කල යුත්තේ දැඩි අවබෝධයකින් යුතුවය. දරුවන් සියලු ආකාරයේ අපයෝජන වලින් ආරක්ෂා කරගැනිම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නිරන්තරයෙන් කටයුතු කරන අතර එම වැඩපිළිවල සාර්ථක කරගැනීම සඳහා නිරතුරුවම සහය වන ලෙසටද මම ඔබෙන් ඉල්ලා සිටිමි.

# සංස්කාරක සටහන



වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ දරුවන් අපයෝජනයට ලක්වීමේ ප්‍රධානතම මෙවලමක් බවට අන්තර්ජාලය පත්ව ඇති බවට විවිධ සාක්ෂි සැපයෙමින් පවතී. නිරන්තරයෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අන්තර්ජාලය තුළ විවිධ හිංසනයන්ට පත්වූ දරුවන් පිළිබඳව තොරතුරු අනාවරණය වී තිබේ. ඒ අතරින් ශ්‍රී ලංකාවේ දරුවන් වැඩි වශයෙන් භාවිතා කෙරෙන මුහුණු පොත හෙවත් Face Book තුළ ළමුන් නිරන්තරයෙන් සැරිසරන අතර ඒ තුළ විවිධ අපයෝජනවලට දරුවන් ගොදුරුවීම වැඩි බවක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන තොරතුරු හා පුවත්පත් වාර්තා අනුව අනාවරණය වේ. එම නිසාම දරුවන් බොහොමයකගේ ජීවිත අඳුරු වී ඇති අතරම දරුවන් කිහිප දෙනෙකුටම සිය ජීවිතයෙන් පවා වන්දි ගෙවන්නට සිදු විය. මෙයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ ශ්‍රී ලංකාව තුළ කිසිදු අධීක්ෂණයකින් තොරව අන්තර්ජාල පහසුකම් අයාලේ යෑමට ඉඩ හැරීම නිසාම අවභාවිතය ඉහල යාම හා ඒ සඳහා පවත්නා නීතිය නිවැරදිව ක්‍රියාත්මක නොවීමයි. එම නිසා මෙම තත්වය පැහැදිලි ලෙසම වෙනස් කළ යුතුය. නිවැරදි අන්තර්ජාල භාවිතය පිළිබඳව ළමයින් මෙන්ම වැඩිහිටියන්ද දැනුවත් කළ යුතුය. විශේෂයෙන් ළබැඳි පුවත් හසුනේ මෙම කලාපය හරහා අප බලාපොරොත්තු වන්නේ අන්තර්ජාලය භාවිතයෙන් සිදු කෙරෙන ළමා අපයෝජන වලින් ළමයින් ආරක්ෂා කිරිමට අවශ්‍ය මතය සමාජගත කිරිමයි. ළමයින් අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගනිමින් ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා මුලු මහත් සමාජයටම ලැබෙන්නේ විශාල වගකිමකි. එකී වගකීම ඉටුකිරීමට සමාජයම ඒකරාශී විය යුතුමය.

# අප සමගින් එක් වන්න

ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
இலங்கை சிறுவர் தொலைபேசி சேவை
ChildLine Sri Lanka
1929


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල,
ශ්‍රී ජයවර්ධනපුර.
දුරකථන - 011 2778911 - 12 - 14
ෆැක්ස් - 011 2778915
විද්‍යුත් තැපැල - ncpa@childprotection.gov.lk
වෙබ් අඩවිය - www.childprotection.gov.lk